ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2006 අංක 38 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 නොවැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි.

# 2006 අංක 38 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 06 වන දින]

එල්.ඩී.—ඕ. 60/2000.

(112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2006 අංක 38 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2) යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වුවහොත් ; හෝ

(ආ) පළාත් සභා මන්ත්‍රීවරයෙක් වුවහොත් ; හෝ

(ඇ) පළාත් පාලන ආයතනයක සභිකයෙක් වුවහොත් ; හෝ

(ඈ) ජනරජය යටතේ වැටුප් ලබන ධුරයක් දරන තැනැත්තකු ; හෝ

(ඉ) රෙජිස්ට්‍රාර්වරයකුගේ රාජකාරි කටයුතු කෙරෙහි අගතිදායක ලෙස බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ වෘත්තියක නියුක්ත වූ තැනැත්තෙක් වූවහොත්,

එම තැනැත්තා රෙජිස්ට්‍රාර්වරයකු ලෙස පත්කර ගැනීමට හෝ එසේ කටයුතු කරගෙන යැමට හෝ සුදුස්සෙක් නොවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව යම් රෙජිස්ට්‍රාර්වරයකු ලෙස කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වන අවස්ථාවක, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම තැනැත්තා රෙජිස්ට්‍රාර් ධුරයෙන් ඉවත් කිරීමේ නියමයන් කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට බලය තිබිය යුතු අතර, එම ඉවත් කිරීම ගැසට් පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) ඉල්ලා අස්වීමක් නිසා හෝ ධුරයෙන් ඉවත් කිරීමක් නිසා රෙජිස්ට්‍රාර්වරයාගේ ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක, මේ වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.